# කොළඹ දිසා අධිකරණයේ දී ය.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වන වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් පිළිබඳව වූ කාරණයක් සම්බන්ධයෙනි.

කොළඹ 10. ශ්‍රී විපුලසේන මාවතේ
අංක 167/4 දරණ ස්ථානයේ
නිහාල් ශ්‍රී අමරසේකර

පැමිණිලිකරු

නඩු අංකය : 19849/එම්. ආර්.

– එරෙහිව –

කොළඹ 2 ස්ටේපල්ස් වීදියේ පිහිටි
"විසුම්පාය" යන ස්ථානයේ සහ
කොළඹ 5 කිරුල පෙදෙසේ
අංක 37 දරණ ස්ථානයේ
ගාමිණී ලක්ෂමන් පීරිස්.

විත්තිකරු

1998ක් වූ මාර්තු මස 11 වන මෙදිනදී ය.

ස්වකීය නීතිඥවරුන් වන ද සිල්වා සහ පෙරේරා නාමය සහ විලාශය යටතේ නීති වෘත්තියේ යෙදී සිටින ජේ.ඩබ්ලිව්.ඩී පෙරේරා මගින් පෙනී සිටිනු ලබන පැමිනිලිකරුගේ පෙත්සමෙහි පහත සඳහන් අයුරු ප්‍රකාශ කෙරේ.

1. පැමිණිලිකරු විසින් අධිකරණයෙන් අවසරය ලැබ, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 94 වගන්තියඅනුව, ලිඛිත විචාරණ විත්තිකරු වෙත භාර කරවන ලදී. පැමිණිලිකරුගේ මෝසම මත අධිකරණය විසින් ඉහත සඳහන් පරිදි අවසරය දෙමින්, ඒවා ලැබ දින 10ක් ඇතුලත විචාරණයන්ට උත්තර දෙන ලෙසට නියෝග කරන ලදී.

2. 1998 මාර්තු 06 වන දින හෝ එදිනට ආසන්නයේ දී විත්තිකරුගේ නීතිඥවරුන් විසින් මෝෂමක් සහ උද්දේශිත විරෝධතා ප්‍රකාශයක් ඉදිරිපත් කරමින්, එම විරෝධතා ප්‍රකාශ නඩුපොතේ ගොනු කරන මෙන් ඉල්ලා ඇති බවත්, එම කාරණය විවෘත අධිකරණයේ සඳහන් කරන ලෙසට අධිකරණය විසින් නියෝග කොට ඇති බව නඩුගොනුව පෙන්නුම් කරයි.

3. 1998 මාර්තු 09 වන දින විවෘත අධිකරණයේ දී එම කාරණය ගණු ලැබූ අවස්ථාවේ, විත්තිකරු පෙනී නොසිටි අතර, ඔහු වෙනුවෙන් නියෝජිතයින් ද නොවීය.. විත්තිකරු විචාරණයන්ට උත්තර දීම ප්‍රතිකෙෂප කර ඇති බව පැමිණිලිකරුගේ නීතිඥවරයාට අධිකරණය විසින් දනුම් දෙන ලදී. පැමිණිලිකරුගේ නීතිඥවරයා එවිට අධිකරණය වෙත දැනුම් දී සිටියේ නීතිය යටතේ විත්තිකරකු විසින් දිව්රුම්පතක් ඉදිරිපත් කළයුතු බවත්, ලියවිලි කිසිවක් හෝ පැමිණිලිකරුට හෝ ඔහුගේ ලේඛණගත නීතිඥවරුන් වෙත භාර දී නොමැති බවත්ය. එම නිසා ලියකියවිලි පැමිණිලිකරු වෙත බාර කරවන ලෙසට විත්තිකරුගේ නීතිඥවරුන්ට නියම කරමින් අධිකරණය විසින් නියෝගයක් දෙන ලදී. මෙදින දක්වාම ඒ කිසිවක් ලැබී නොමැත.

4. ඉන් අනතුරුව එදිනම , එනම් 1998 මාර්තු 09 වන දින පැමිනිලිකරු විසින් නඩුගොනුව පරීක්ෂා කරවනු ලැබ:

   අ) 1998 මාර්තු මස 6 දිනැති මෝසමක් ඉදිරිපත් කර තිබූ අතර,

   ආ) ඒ සමග ඉදිරිපත් කර තිබූ විරෝධතා ප්‍රකාශය නඩු පොතේ ගොනුකර තබන ලෙසට අයැද තිබූ අතර,

   ඇ) එය සත්‍යාප කර තිබුනේවත්,

   ඈ) පැමිණිලිකරුට ඒ පිළිබඳව දැනුම් දීමක් කර තිබුනේවත්,

   ඉ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 99 වැනි වගන්තිය ප්‍රකාර දිවුරුම් පතක් ඉදිරිපත් කර තිබුනේවත්

නැති බව සොයා ගන්නට යෙදුනෙන්, විත්තිකරු විසින් ගොනු කරනු ලැබ ඇති ලියකියවිලි නීතියට පටහැනි වන බැවින් ඒවා ප්‍රතික්ෂේප කරන ලෙසට පැමිනිලිකරු විසින් 1998 මාර්තු 09 දිනැති මෝෂම මගින් ඉල්ලා සිටින ලදී. විත්තිකරුටද දැනුම් දීමක් සහිත වූ එම1998 මාර්තු 09 දිනැති මෝසමෙහි පිටපතක් "X" යනුවෙන් සළකුණු කොට මෙයට යා කොට ඇත

5. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 99 වන වගන්තියේ නියමය නොපිළිපැදීම එකී විචාරණවලට විත්තිකරු උත්තර නොදීම හිතුවක්කාර පැහැර හැරීමකට සමාන බවත් එය අධිකරණයේ නියෝගය නො පිළි පැදීමක් බවත් පැමිණිලිකරු ගෞරව පූර්වකව ප්‍රකාශ කරයි.

6. කරුණු තිබෙන හැටියට අභිමුඛ පරීක්ෂණයක් මගින් හෝ දිවුරුම්පතක් මගින් එකී විචාරනවලට උත්තර දීමට විත්තිකරුට නියම කරමින් නියෝගයක් ලබා ගැනීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයේ 100 වගන්තිය යටතේ ඉල්ලා සිටීමට පැමිණිලිකරුට හිමිකම් තිබේ.

7. මෙහි අඩංගුව තිබෙන සම්ප්‍රකාශයන් සනාථ කිරීම සම්බන්ධව පැමිණිලිකරුගේ දිවුරුම්පතක් මෙයට යාකොට ඇත.

එබැවින්: ගරු අධිකරණය:

(අ) මෙම පෙත්සම පිළිබඳ නොතීසි විත්තිකරු වෙත නිකුත් කරන ලෙසට,

(ආ) අභිමුඛ පරීක්ෂණයක් මගින් හෝ දිවුරුම් පතකින් එකී විචාරනවලට උත්තර දීමට විත්තිකරුට නියම කරමින් නියෝගයක් කරන ලෙසට,

(ඇ) නඩු ගාස්තු ලබා දෙනලෙසට, සහ

(ඈ) ගරු කටයුතු ඔබ තුමාගේ අධිකරණයට මැනැවැයි පෙනී යන එවැනි වෙනත් සහ වැඩිදුර සහනයන් ලබා දෙන ලෙසට,

පැමිණිලිකරු අයැද සිටී.

පැමිණිලිකරුගේ නීතිඥවරුන්.

"X"

# කොළඹ දිසා අධිකරණයේ දී ය.

කොළඹ 10. ශ්‍රී විපුලසේන මාවතේ
අංක 167/4 දරණ ස්ථානයේ
නිහාල් ශ්‍රී අමරසේකර

පැමිණිලිකරු

නඩු අංකය : 19849/එම්. ආර්.

– එරෙහිව –

කොළඹ 2 ස්ටේපල්ස් වීදියේ පිහිටි
"විශුම්පාය" යන ස්ථානයේ සහ
කොළඹ 5 කිරුළ පෙදෙසේ
අංක 37 දරණ ස්ථානයේ
ගාමිණී ලක්ෂමන් පීරිස්.

විත්තිකරු

අද දින අධිකරණයේ නිති සෘතියට අනුව, විත්තිකරු විවාරණවලට උත්තර දීම ප්‍රතික්ෂෙප කර ඇති බව පැමිණිලිකරුට අධිකරණය දන්වූ විට

මෙම කාරණය සම්බන්ධව පැමිණිලිකරු වෙනුවෙන් නඩු පොත පරීක්ෂා කළ අතර, විත්තිකරු:

අ) 1998 මාර්තු මස 6 දිනැති මෝසමක් ඉදිරිපත් කර තිබූ අතර,

ආ) ඒ සමග ඉදිරිපත් කර තිබූ විරෝධතා ප්‍රකාශය නඩු පොතේ ගොනුකර තබන ලෙසට අයැද තිබූ අතර,

ඇ) එය සනාථ කර තිබුනේවත්,

ඈ) පැමිණිලිකරුට ඒ පිළිබඳව දැනුම් දීමක් කර තිබුනේවත්,

ඉ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 99 වැනි වගන්තිය ප්‍රකාර දිවුරුම් පතක් ඉදිරිපත් කර තිබුනේවත්

නැති හෙයින්ද,

එකී මෝසම සහ විරෝධතා ප්‍රකාශය නිතියට පරස්පර විරෝධී හෙයින්, ඒවා ප්‍රතික්ෂෙප කරන ලෙසට අපි අයැද සිටිමු.

මෙම ක්‍රියාව, නිතියෙන් නියම කර ඇති පරිදි විවාරණවලට නිසි ලෙස උත්තර දීම පැහැර හැරීම සම්බන්ධයෙන් විත්තිකරුගේ හිතුවක්කාර සහ බලවත් අකීකරු ක්‍රියාවක් වශයෙන් සලකනු ලබන අතර, නිතියෙන් විධාන කර ඇති පරිදි විවාරණවලට උත්තර දීමට විත්තිකරුට නියම කරමින් නියෝගයක් කිරීමට අධිකරණයෙන් ඉල්ලා සිටීමට පැමිණිලිකරු යථා කාලයේදී පියවර ගනු ලබන හෙයින්ද

මෙම කාරණාව, පැමිණිලිකරුගේ නිතිඥ මහතාට සනාථ කිරීමට හැකිවනයේ, 1998 මාර්තු 13 දින විවෘත අධිකරණයේ සඳහන් කරනු ලැබීමට අපි තවදුරටත් අයැද සිටිමු.

1998 ක්වූ මාර්තු 9 වැනි දින, කොළඹ දී ය

පැමිණිලිකරුගේ නිතිඥවරුන්

මෙම මෝසමේ පිටපතක් විත්තිකරුගේ නිතිඥයින් වෙත ලියාපදිංචි තැපැලෙන් යවනු ලැබ, එය සනාථ කිරීම පිණිස ලියාපදිංචි තැපැල් භාණ්ඩ කුවිතාන්සිය අමුණා ඇත.

පැමිණිලිකරුගේ නීතිඥවරුන්.

TRUE COPY